# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
# மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
# Ministry of Mahaweli Development and Environment

"සොබාදම් පියස" , අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச" , இல. 416/சீ/1, ரொபர்ட் குணவர்தன மாவத்தை , பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No: 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.

Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121

ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MMDE/06/FR/02 වන රෝපා 2018 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2018/08/30 |

**පරිසර චක්‍රලේඛ අංක 01/2018**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශිය ලේකම්වරුන්
ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය සමාගම් ප්‍රධානීන්

## "වන රෝපා" වැඩසටහන - 2018

**01. අරමුණ**

1.1 ශ්‍රී ලංකාවේ වන ආවරණය 32% ක් දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනිමේ අරමුණින් පරිසර විෂයභාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් මත "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාවට නංවා ඇති අතර සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය "වන රෝපා" ජාතික රුක් රෝපණ මාසය ලෙස නම් කර ඇත. ඒ යටතේ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් මෙම වසරේද ඔක්තෝබර් 01 සිට 31 දින දක්වා මෙම වැඩසටහන පැවැත්වීමට සූදානම් කර ඇති අතර, එහි ප්‍රධාන උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔක්තෝබර් මස 05 දින මන්නාරම දිස්ත්‍රික්කයේ දී පැවැත්වේ.

1.2 සුවිශේෂි පාරිසරික පද්ධති සුරැකීම හා ඒ ආශ්‍රිත වන වගා ප්‍රවර්ධනය, ආරක්ෂාව හා නඩත්තුව, ජනාවාස ආශ්‍රිතව තුරු වියන් සැකසීමට දායක වන ගස් වැවීමෙන් අප ජීවත්වන පරිසරයේ හරිත බව ප්‍රවර්ධනය හා එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන බව තහවුරු කිරීම, හායනයට ලක් වූ භූමි ප්‍රදේශ සුවිශේෂ රුක් රෝපණ ක්‍රමවේද තුළින් ප්‍රතිස්ථාපනය වැනි තිරසර වන රෝපණයන් ඇති කිරීම කෙරෙහි ජනතාව යොමු කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

1.3 එමෙන්ම වන විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් අළුතින් වන වගා ඇතිකිරීමෙන් වන ගහණය වැඩි කිරීම හා පවත්නා වන වැස්මේ ගුණාත්මක භාවය වැඩි කිරීම ද අපේක්ෂා කරන අතර හඳුනාගත් නිශ්චිත භූමි ප්‍රදේශයන්හි එනම්, කඳු මුදුන්, ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ, හායනයට ලක් වූ වෙනත් භූමි සහ වෙරළ තීර ආශ්‍රිතව හරිත බව ප්‍රවර්ධනය වනසේ රුක් රෝපණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

**02. උපාය මාර්ග**

2.1 බහුවිධ ප්‍රවේශයන් මගින් ජනතාව තුළ රුක් රෝපණය පිළිබඳ ධනාත්මක ආකල්ප ජනිත කරවමින් තමන් විසින් ම නිෂ්පාදනය කරන ලද පැළ රෝපණය කිරීමට පෙළඹවීම හා තම ප්‍රදේශයට ආවේණික ශාක මෙන්ම ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පැළ තවාන් ඇති කිරීම සුදුසු බව යෝජනා කෙරේ. එමගින් ජනතාව ස්වේච්ඡාවෙන්ම රුක් රෝපණය සඳහා යොමු කරගැනීමට මෙම වැඩසටහන පිටුවහලක් කරගන්නා ලෙස ඉල්ලන අතර තමන්ගේ හෝ තම පවුලේ සාමාජිකයන්ගේ ජීවිතය හා සම්බන්ධ සුවිශේෂීය දිනයන් සැමරීම, ජාතික වශයෙන් වැදගත් දින සැමරීමට රුක් රෝපණය යොදා ගැනීම, ඔබ විසින් නිපදවන වටිනාකමක් සහිත පැළ හිත මිතුරන් සමග හුවමාරු කිරීම සහ ත්‍යාග ලෙස පැළ ලබාදීම මගින් මෙම වැඩසටහන අර්ථවත් කළ හැකිය.

2.2 ත්‍රිවිධ හමුදාවේ සහ සිවිල් ආරක්ෂක බලකායේ සක්‍රීය දායකත්වයෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව මෙන්ම තිරසාරව රුක්රෝපණ වැඩසටහන් පැවැත්වීමට හැකිවේ. ඒ අනුව, අදාළ කඳවුරු භූමිවල පවතින වන වගාවට සුදුසු භූමිවල ද, යම් කාර්යයන් සඳහා යොදාගෙන දැනට හායනය වූ තත්ත්වයේ පවතින භූමි තුළ ද තම ප්‍රදේශයට ආවේණික හා දේශගුණික කලාපයට සුදුසු පැළ රෝපණය කිරීමට කටයුතු කිරීම වඩාත් සුදුසුය.

2.3 රාජ්‍ය අයතන තුළ "පරිසර කව" පිහිටුවා එමගින් ප්‍රදේශයට සුදුසු පැළ තවාන් සකස් කිරීමෙන් සහ සේවකයන් රාජකාරියෙන් බැහැරව ගතකරන කාලයන්හි පැළ තවාන්හි කටයුතුවල නියැලීමට පෙළඹවීම මගින් ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීමට ද හැකි වේ.

2.4 තුරු ආවරණය ඉහළ නැංවීම සඳහා විවිධ තුරු වියන් ස්ථරවලින් සමන්විත වන වගාවක් පහසුකම් ඇති සෑම ස්ථානයකම ස්ථාපනය කිරීමට පියවර ගැනීම මගින් රුක් රෝපණයෙන් අපේක්ෂිත බහුවිධ ප්‍රයෝජනයන් ජාතියට උරුම කිරීමට ද රුක්රෝපණ වැඩසටහන අවස්ථාවක් කරගත යුතුවේ.

## 03. ක්‍රමවේදය

3.1 සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් විසින් තම පළාතේ එක් එක් පළාත් පාලන බල ප්‍රදේශ වල එවැනි හඳුනා ගත් නිශ්චිත ස්ථානයන්හි රුක් රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත නොපමාව ලබාදෙන මෙන් ඉල්ලමි. එම රුක්රෝපණ වැඩසටහන් සඳහා ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන වල සහභාගීත්වය හා සමස්ථ පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීමට පියවර ගනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

3.2 මෙම ජාතික වනරෝපා වැඩ සටහන රටෙහි පවතින වර්ෂා කාලය අනුව, දීප ව්‍යාප්තව, එළඹෙන රුක් රෝපණ මාසය තුල ආරම්භ කර අඛණ්ඩව වසර පුරා ක්‍රියාත්මක කරන ලෙස ද ඉල්ලා සිටිමි.

3.3 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 වන රෝපා වැඩ සටහනට සමගාමීව දිවයින පුරා විවිධ ස්ථානවල පැල මිලියන 2 කට ආසන්න ප්‍රමාණයක් සිටුවීමට සැලසුම් කර ඇති බවද දන්වා සිටිමි.

3.4 එමෙන්ම, මෙම වැඩසටහන සියලුම රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතු අතර එවැනි සෑම මට්ටමකින්ම ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා අවශ්‍ය පැළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ රාජ්‍ය දැව සංස්ථාව මගින් ලබාගැනීමේ හැකියාව ඇත. (ලබාගත හැකි පැළ පිළිබඳ තොරතුරු මේ සමග අමුණා ඇත) මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු දිස්ත්‍රික් පරිසර කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරන ලෙසද, වන රෝපා වැඩසටහන අනෙකුත් ආයතන හා එක්ව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහය වීම සඳහා එම කමිටුවේ ලේකම් වශයෙන් දිසා වන නිලධාරීන් පත්කර ගන්නා ලෙසද ඉල්ලමි. එසේම ජාතික රුක්රෝපණ මාසය තුල සිටුවනු ලබන පැල සංඛ්‍යාව හා පැල වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් සකස් කරනු ලබන සංක්ෂිප්ත වාර්තාවක් දිසා වන නිලධාරී මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට කටයුතු කළ යුතුය.

3.5 ඊට අමතරව ඉහත වැඩ සටහනට සමගාමීව පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය මට්ටමෙන් 2018 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට 31 දක්වා වු මාසයක කාල සීමාව තුළදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කරන මෙන් ද කාරුණිකව ඉල්ලමි.

3.6 මෙම රුක් රෝපණ වැඩ සටහන යටතේ සිටුවන සෑම පැළයක්ම රැක බලා ගැනීම, නඩත්තු කිරිම හා වාර්තා පවත්වා ගැනීම අතිශයින් වැදගත් වන අතර ඒ අනුව මෙම කාර්යයට සම්බන්ධ වන ආයතන විසින් මේ සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් සිදු කිරිම උචිත යැයි ද යෝජනා කරමි.

## 04. සම්බන්ධීකරණය

4.1 "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩ සටහන ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය කිරිම සඳහා අවශ්‍ය තොරතුරු මෙම අමාත්‍යාංශයේ වන සම්පත් අංශයේ අධ්‍යක්ෂ වෙතින් ලබා ගත හැකි අතර එහි දුරකථන අංකය 011 2034228 හා ෆැක්ස් අංකය 011 2879977 වන අතර විද්‍යුත් තැපැල - dirfr@mmde.gov.lk

අනුර දිසානායක
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

පිටපත් :
1. ජනාධිපති ලේකම් - දැන ගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම් - දැන ගැනීම පිණිස
3. විගණකාධිපති - දැන ගැනීම පිණිස
4. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
6. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
7. සභාපති, ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
8. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
9. සභාපති, රාජ්‍ය දැව සංස්ථාව
10. සභාපති, භූ විද්‍යා හා පතල් කාර්යාංශය
11. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
12. සභාපති, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
13. සභාපති, සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය

(5 – 13) අවශ්‍ය සහාය ලබා දීම සඳහා

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පැළ ලබාගත හැකි ස්ථාන

ඇමුණුම I

| දිස්ත්‍රික්කය | දිසා වන කාර්යාලයේ ලිපිනය හා දුරකථන අංකය | තවාන පිහිටි ස්ථානය | පැල වර්ගය | පැල ප්‍රමාණය |
|---|---|---|---|---|
| අම්පාර | දිසා වන නිලධාරී කාර්යාලය, අම්පාර ටෙලි. 0632222054 | පරගහකැලේ | තේක්ක, සියඹලා, කායා, කුඹුක්, කොස් | 8,000 |
| අනුරාධපුර | දිසා වන නිලධාරී කාර්යාලය, අනුරාධපුර ටෙලි. 025 - 2222664 | කෝපාකුලම, කලාඔය | තේක්ක, හල්මිල්ල ,පලු, මී | 12,000 |
| පොලොන්නරුව | දිසා වන නිලධාරී කාර්යාලය, පොලොන්නරුව ටෙලි. 027-2225963 | ඊරිගෙඔය මධ්‍යම පැල තවාන | තේක්ක, ඇහැළ, කුඹුක්, කොහොඹ, බුරුත, හල්මිල්ල, වීර | 5,000 |
| ත්‍රිකුණාමලය | දිසා වන නිලධාරී කාර්යාලය, ටෙලි. 026- 2222306 | දිසා වන කාර්යාලය | තේක්ක, කුඹුක්, කොහොඹ, මාදං, කොට්ටම්බා, මී | 30,000 |
| මඩකලපුව | දිසා වන නිලධාරී කාර්යාලය, මඩකලපුව ටෙලි. 065-2222355 | දිසා වන කාර්යාලය | තේක්ක, පිහිඹියා, කායා, බුරුත | 5,000 |
| රත්නපුර | දිසා වන නිලධාරී කාර්යාලය, රත්නපුර ටෙලි. 045-2222171 | ඇඹිලිපිටිය | තේක්ක, ඇහැළ, කුඹුක්, කොහොඹ, මී, නා,මයිල, මහෝගනී,පෙලෙන්, බටදොඹ | 25,000 |
| කෑගල්ල | දිසා වන නිලධාරී කාර්යාලය, කෑගල්ල ටෙලි. 035-2222752 | නාරංබැද්ද | දිවුල්, මුණමල්, කොහොඹ, කොස්, කුඹුක්, සියඹලා, කෝන් | 20,000 |
| ගාල්ල | දිසා වන නිලධාරී කාර්යාලය, ගාල්ල ටෙලි. 091 - 2232994 | කන්නෙලිය , කොට්ටව | නා, බටදොඹ, මහෝගනී, කුඹුක්, නැඳුන්, ගිනිසපු, ගොරකා | 8,000 |
| මාතර | දිසා වන නිලධාරී කාර්යාලය, මාතර ටෙලි. 041-2229414 | නාදුගල, විල්පිට | කුඹුක්, හොර, මී, නා, සියඹලා, ලුණුමිදෙල්ල,නැඳුන් | 10,000 |
| හම්බන්තොට | දිසා වන නිලධාරී කාර්යාලය, හම්බන්තොට ටෙලි. 047-2220371 | රිදියගම | තේක්ක, බුරුත, ඇහැළ, ගම්මාළු, දිවුල්, හල්මිල්ල, පිහිඹියා, කායා, කොහොඹ, පලු, කුඹුක් | 20,000 |
| මොණරාගල | දිසා වන නිලධාරී කාර්යාලය, මොණරාගල ටෙලි. 055-2276643 | හඳපානගල | කායා, කුඹුක්, සියඹලා, පිහිඹියා, කොබෝනීල | 5,000 |
| බදුල්ල | දිසා වන නිලධාරී කාර්යාලය, බදුල්ල ටෙලි. 055 - 2226012 | මීගහකිවුල | කුඹුක්, ඉයුකැලිප්ටස්, කොස්, සියඹලා | 5,000 |
| නුවරඑළිය | දිසා වන නිලධාරී කාර්යාලය, නුවරඑළිය ටෙලි. 052-2222329 | රම්බොඩ | ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්, කහකෝණ, දඹ, කීන, හවරිනුග, සයිප්‍රස් | 5,000 |
| මහනුවර | දිසා වන නිලධාරී කාර්යාලය, මහනුවර ටෙලි. 081-2232873 | පොල්ගොල්ල | පිහිඹියා, මහෝගනී, කිණිහිරියා, කොහොඹ, ටූනා, හල්මිල්ල | 20,000 |
| මාතලේ | දිසා වන නිලධාරී කාර්යාලය, මාතලේ ටෙලි. 066-2222138 | දියබුබුල, ඉඹුල්දණ්ඩ | කිරිපලු, තෙළඹු, ලුණුමිදෙල්ල, මොර, කුඹුක්, වා, සියඹලා, කොහොඹ, බුළු | 20,000 |
| කළුතර | දිසා වන නිලධාරී කාර්යාලය, කළුතර ටෙලි. 034-2222138 | වග,ඉංගිරිය,මතුගම,අගල වත්ත, රත්මලාන,දෙපානම | කුඹුක්, මහෝගනී, නා, ඇටඹ, පාරේමාර, හල්මිල්ල, මාදං, බටදොඹ | 10,000 |
| කුරුණෑගල | දිසා වන නිලධාරී කාර්යාලය, කුරුණෑගල ටෙලි. 037-2222127 | වැවරවුම, කුරුණෑගල අඩවිය; අඩවි වන නිලධාරී කාර්යාලය - මහව | තේක්ක, කායා, කොහොඹ, හල්මිල්ල | 10,000 |
| ගම්පහ | දිසා වන නිලධාරී කාර්යාලය, ගම්පහ ටෙලි.033 2225890 | හොර කැලේ පැල තවාන, මීරිගම | කුඹුක්,මී, මාර, බුළු, කොස් | 5,000 |
| පුත්තලම | දිසා වන නිලධාරී කාර්යාලය, පුත්තලම ටෙලි. 032-2265360 | කලාඔය පැල තවාන; ඉඟිනිමිටිය මධ්‍යම පැල තවාන | තේක්ක, ඇහැල, පිහිඹියා, නා, හල්මිල්ල,පලු | 5,000 |
| වව්නියාව | දිසා වන නිලධාරී කාර්යාලය, වව්නියා ටෙලි. 024-2222381 | පම්පේමඩුව | තේක්ක, දිවුල්, කුඹුක්, කායා, බුළු, කෝන් | 24,000 |
| මන්නාරම | දිසා වන නිලධාරී කාර්යාලය, මන්නාරම ටෙලි. 023 – 2250668 | අඩවි වන නිලධාරී කාර්යාලය | තේක්ක, කුඹුක්, කායා, කළුවර, වීර, හල්මිල්ල | 24,000 |
| මුලතිව් | දිසා වන නිලධාරී කාර්යාලය, මුලතිව් ටෙලි. 024 – 3248828 | වසන්තපුරම් | තේක්ක, ඇහැළ, මී, දිවුල්, කායා, පිහිඹියා, බුළු, කොස් | 14,000 |
| කිලිනොච්චිය යාපනය | දිසා වන නිලධාරී කාර්යාලය, කිලිනොච්චිය ටෙලි. 021 - 2285498 | පොන්නගර් | තේක්ක, ඇහැළ, කුඹුක්, සියඹලා, මල් ඇහැළ | 10,000 |
| **එකතුව** | | | | **300,000** |

# 2018 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව මගින් පැළ ලබාගතහැකි ස්ථාන

| ප්‍රාදේශිකය | තවාන | ලබාගත හැකි පැළ | ප්‍රමාණය | දුරකථන අංක |
|---|---|---|---|---|
| රත්නපුර | මිදලන | හොර | 190 | 045-2228948 |
| | | නා | 1501 | |
| | | මී | 45 | |
| | | කිතුල් | 20 | |
| | | මහෝගනී | 835 | |
| | | පේර | 10 | |
| | | පිහිඹියා | 9 | |
| | | ඇලස්ටෝනිය | 40 | |
| | | කොකෝවා | 40 | |
| | | මොර | 40 | |
| | | ඇල්බීසියා | 160 | |
| | | නැදුන් | 410 | |
| | | කුඹුක් | 770 | |
| | | අඹ | 78 | |
| | | දූරියන් | 782 | |
| | | දොඹ | 10 | |
| | | ගොරකා | 35 | |
| | | රඹුටන් | 990 | |
| | | වල් ජම්බු | 13 | |
| | | කොස් | 60 | |
| | | මිල්ල | 15 | |
| | | වෙනත් | 5000 | |
| | තිබෝල්කැටිය | දොඹ | 5 | 047-2233206 |
| | | අඹ | 12 | |
| | | තේක්ක | 15 | |
| | | මහෝගනී | 70 | |
| | | බුරුත | 50 | |
| | | කොස් | 55 | |
| | | කුඹුක් | 50 | |
| | | මී | 25 | |
| | | කෝන් | 80 | |
| | | වෙනත් | 500 | |
| | ප්‍රාදේශීය කාර්යාලය | නා | 100 | 045-2228948 |
| | | දුන් | 30 | |
| | | මහෝගනී | 80 | |
| | | කුඹුක් | 75 | |
| | | බුරුත | 5 | |
| | | මිල්ල | 5 | |
| | | කැටකැල | 5 | |
| | | හොර | 10 | |
| පොළොන්නරුව | මින්නේරිය | මී | 2997 | 027-2246287 |
| | | කුඹුක් | 1759 | |
| | | හුලංහික් | 1050 | |
| | | පිහිඹියා | 75 | |
| | | හල්මිල්ල | 2595 | |
| | | තේක්ක | 532 | |
| | | ඇහැල | 2000 | |
| | | ගොඩකිරල | 1 | |
| | | තෙලඹු | 70 | |
| | | කළුවර | 75 | |
| | | අටතිඹිරි | 125 | |
| | | කොහොඹ | 1734 | |
| | | පළු | 15 | |
| | | ලාවළු | 35 | |
| | | කොස් | 768 | |
| | | කැටකැල | 25 | |
| | | මාදං | 50 | |
| | | වැලි අනෝදා | 10 | |
| | | කෝන් | 370 | |
| | | දොඩම් | 1 | |
| | | ප්‍රෝන්ස් | 50 | |
| | | මදටිය | 8 | |
| | | වෙනත් | 500 | |
| මොණරාගල | කුඹුක්කන | කුඹුක් | 1159 | 055-2273797 |
| | | පිහිඹියා | 45 | |
| | | තේක්ක | 310 | |
| | | කොහොඹ | 35 | |
| | | බුරුත | 76 | |
| | | කොස් | 5 | |
| | | මහෝගනී | 125 | |
| | | කෝන් | 95 | |
| | | බෙලි | 2 | |
| | | කුඩුදවුල | 390 | |
| | | වෙනත් | 4000 | |
| | වැල්ලවාය | ඇත්දෙමට | 115 | 055-2274338 |
| | | කුඹුක් | 545 | |
| | | පිහිඹියා | 290 | |
| | | කොස් | 235 | |
| | | මී | 305 | |
| | | කළුවර | 30 | |
| | | බුළු | 19 | |
| | | තිඹිරි | 10 | |
| | | කුඩුදවුල | 220 | |
| | | තේක්ක | 641 | |
| | | මහෝගනී | 440 | |
| | | තෙලඹු | 30 | |
| | | මාදං | 295 | |
| | | කායා | 10 | |
| | | ඇහැල | 43 | |
| | | කෝපි | 160 | |
| | | ජම්බු | 140 | |
| | | රඹුටන් | 74 | |
| | | අඹ | 20 | |
| | | සියඹලා | 80 | |
| යාපනය | නල්ලූර් | කුඹුක් | 54 | 021-2216610 |
| | | කොස් | 1555 | |
| | | සියඹලා | 230 | |
| | | කොහොඹ | 265 | |
| | | පාරමාර | 225 | |
| | | මහෝගනී | 1106 | |
| | | දඹ | 170 | |
| | | තේක්ක | 65 | |
| | | අඹ | 231 | |
| | | හල්මිල්ල | 16 | |
| | | වෙනත් | 2000 | |
| බණ්ඩාරවෙල | මිරිස්වත්ත | තේක්ක | 1800 | 077-7185236 |
| | | තෙලඹු | 100 | |
| | | බටදොඹ | 1200 | |
| | | හුලංහික් | 130 | |
| | | දෙළුම් | 625 | |
| | | වූනා | 60 | |
| | | මහෝගනී | 300 | |
| | | පිහිඹියා | 90 | |
| | | මී | 1520 | |
| | | කුඹුක් | 600 | |
| | | රඹුටන් | 170 | |
| | | සපු | 20 | |
| | | නා | 380 | |
| | | ගැටදොඹ | 5 | |
| | | උගුරැස්ස | 15 | |
| | | කීන | 50 | |
| | | හොර | 100 | |
| | | ජම්බු | 160 | |
| | | මාදං | 20 | |
| | | කොස් | 590 | |
| | | කිලෝ පේර | 70 | |
| | | දෙල් කොස් | 50 | |
| | | ඇහැල | 10 | |
| | | නාරං | 30 | |
| | | ඇටඹ | 70 | |
| | | වෙනත් | 2000 | |

| ප්‍රාදේශිකය | තවාන | ලබාගත හැකි පැල | ප්‍රමාණය | දුරකථන අංක |
|---|---|---|---|---|
| නුවරඑළිය | කිතුල්ගල | රඹුටන් | 1370 | 036-2287521 |
| | | අඹ | 350 | |
| | | ටූනා | 200 | |
| | | දූරියන් | 1250 | |
| | | නා | 30 | |
| | | පිහිඹියා | 200 | |
| | | ජම්බු | 358 | |
| | | නං නං | 200 | |
| | | මහෝගනී | 340 | |
| | | කොස් | 1600 | |
| | | නා ඉඹුල් | 20 | |
| මාතර | උණවටුන | නා | 500 | 091-2245733 |
| | | මූනමල් | 216 | |
| | | මහෝගනී | 4000 | |
| | | ගොරකා | 88 | |
| | | නැදුන් | 500 | |
| | | ඇහැල | 9 | |
| | | දොඹ | 31 | |
| | | ලෝලු | 41 | |
| | | බටදොඹ | 42 | |
| | | පෙලන් | 310 | |
| | | බැදිදෙල් | 128 | |
| | | පිහිඹියා | 629 | |
| | | කොස් | 2000 | |
| | | වෙනත් | 2500 | |
| | අම්බලන්ගොඩ | හල්මිල්ල | 50 | 091-2255258 |
| | | මහෝගනී | 200 | |
| | | දොඹ | 80 | |
| අම්පාර | අම්පාර | කොස් | 173 | 063-2222413 |
| | | කුඹුක් | 93 | |
| | | දොඹ | 7 | |
| | | කෝන් | 7 | |
| | | කැටකෑල | 1 | |
| | | තේක්ක | 9 | |
| | | පේර | 16 | |
| | | දිවුල් | 80 | |
| | | කළුවර | 12 | |
| | | පිහිඹියා | 115 | |
| | | හල්මිල්ල | 1 | |
| | | කොහොඹ | 8 | |
| | | කජු | 34 | |
| | | හල්මිල්ල | 5 | |
| | | වෙනත් | 2500 | |
| මහනුවර | මාතලේ | පිහිඹියා | 1100 | 066-2230567 |
| | | මී | 250 | |
| | | මහෝගනී | 250 | |
| | | කොස් | 150 | |
| | | හල්මිල්ල | 100 | |
| | | කුඹුක් | 120 | |
| | | වෙනත් | 3500 | |
| | ඇත්ගාල | ඇලස්ටෝනියා | 39 | 081-2056136 |
| | | ටූනා | 220 | |
| | | මහෝගනී | 1030 | |
| | | මී | 354 | |
| | | නා | 342 | |
| | නෙළුන්දෙනිය | දූරියන් | 40 | 035-2284437 |
| | | රඹුටන් | 110 | |
| | | අඹ | 65 | |
| | | වෙනත් | 2000 | |
| | පල්ලෙකැලේ | කොස් | 488 | 081-2421535 |
| | | මහෝගනී | 242 | |
| | | ටූනා | 53 | |
| | | කොහොඹ | 76 | |
| | | වෙනත් | 1200 | |

| ප්‍රාදේශිකය | තවාන | ලබාගත හැකි පැල | ප්‍රමාණය | දුරකථන අංක |
|---|---|---|---|---|
| අනුරාධපුර | මැදවච්චිය | කොස් | 1500 | 025-2245665 |
| | | කළුවර | 1000 | |
| | | පිහිඹියා | 330 | |
| | | ගොඩකිරල | 30 | |
| | | දොඹ | 1000 | |
| | | නෙරළු | 30 | |
| | | හල්මිල්ල | 85 | |
| | | කුඹුක් | 750 | |
| | | මී | 173 | |
| | | තේක්ක | 600 | |
| | | මාදං | 200 | |
| කුරුණෑගල | නිකවැරටිය | කොහොඹ | 3523 | 037-2260909 |
| | | ඇහැල | 27 | |
| | | මී | 664 | |
| | | තේක්ක | 280 | |
| | | මාදං | 551 | |
| | | ඇත්දෙමට | 90 | |
| | | සියඹලා | 130 | |
| | | පලු | 160 | |
| | | මහෝගනී | 7 | |
| | | මයිල | 30 | |
| | | කළුවර | 30 | |
| | | කොස් | 1800 | |
| | | කුඹුක් | 408 | |
| | | වෙනත් | 1000 | |
| | කංකානියමුල්ල | කොස් | 1600 | 037-2282683 |
| | | මහෝගනී | 400 | |
| | මැල්සිරිපුර | කුඹුක් | 800 | 037-2250380 |
| | | මහෝගනී | 500 | |
| | | කොස් | 700 | |
| කොළඹ | කල්දෙමුල්ල නව ගබඩාව | කොස් | 265 | 011-2637179 |
| | | රඹුටන් | 103 | |
| | | කොහොඹ | 30 | |
| | | කුඹුක් | 250 | |
| | | තේක්ක | 4000 | |
| | | කළුවර | 100 | |
| | මීරිගම | කොස් | 550 | |
| | | කළුවර | 50 | |
| | | මැහෝගනී | 225 | |
| | | වෙනත් | 1200 | |
| | කඩවත | කොස් | | |
| | | මී | | |
| | | මහෝගනී | | |
| කල්දෙමුල්ල සංකීර්ණය | කල්දෙමුල්ල සංකීර්ණය | කිතුල් | 36 | 011-2623359 |
| | | පුවක් | 65 | |
| | | රඹුටන් | 529 | |
| | | අඹ | 5 | |
| | | දොඹ | 30 | |
| | | නා | 319 | |
| | | කුඹුක් | 142 | |
| | | තේක්ක | 2 | |
| | | මී | 433 | |
| | | මහෝගනී | 25 | |
| | | කළුවර | 37 | |
| | | වෙනත් | 4000 | |
| කැප්පෙටිපොල | කැප්පිටිපොල | කොස් | 25 | 057-2280044 |
| | | ටූනා | 220 | |
| | | ඉයුකලිප්ටස් | 275 | |
| | | මුළු පැල | 520 | |